පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2024/07

මගේ අංකය - එන්සීපී/සීඑස්/පීටී/එෆ්ආර්/05/
පළාත් භාණ්ඩාගාරය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.
2024.05.08

සියලුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන ප්‍රධානීන් වෙත,

**<u>පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ඇප.</u>**

රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරියට අනුකූලව රජයේ මුදල්, ආදායම්, මුද්දර, චෙක්පත් හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම එසේ නැතහොත්, මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පැවරනු ලැබ ඇති හෝ නිලධාරීන් ද වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට ඇප තැබීම සිදු කල යුතු වේ.

02. 2008.04.18 වන දිනැතිව උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 19(5) හා 20(3) වගන්තිය යටතේ පළාත් සභා අරමුදල සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලය යටතේ 2008.05.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලාත්මක කර ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය - 2008 හි 6 වැනි කොටසේ ඇතුළත් රීති අංක 546 සිට 555 දක්වා වන රීතීන් හි උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ඇප තැබීමේ ක්‍රියාපටිපාටිය නියම කරමින් විධිවිධාන අතුළත් කර ඇත.

03. ඒ අනුව උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ වල දෙපාර්තමේන්තුවල හා ආයතන/කාර්යාලවල අදාල වන පළාතේ රාජ්‍ය සේවයේ හා එම සේවාවට අන්තර්ග්‍රහනය කල සියළු නිලධාරීන් විසින් ද මුදල් පාලනය සඳහා සවිස්තරාත්මකව මූල්‍ය රීති හා කාර්යය පටිපාටික රීති සකස් කර නොමැති උතුරු මැද පළාත් සභාවේ ප්‍රඥප්ති මගින් ස්ථාපිත කර ඇති ආයතන වල අදාල නිලධාරීන් විසින් ද උක්ත පළාත් මූල්‍ය රීති 546 සිට 555 දක්වා රීතීන්හි දක්වා ඇති විධිවිධාන අනුගමනය කර ඇප තැබිය යුතු වේ.

04. එසේම, පළාත් සභා රාජ්‍ය නිලධාරීන්ගේ ඇප යන මැයෙන් යුතුව උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් විසින් 1999.11.03 දිනැතිව නිකුත් කර ඇති අංක 04/1999 දරණ ආයතන චක්‍රලේඛය තවදුරටත් වලංගු නොවන බවද වැඩි දුරටත් දැනුම් දෙමි.

ආර්.එම්.ඩබ්.එස්.සමරදිවාකර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත

පිටපත්.

01. විගණකාධිපති — දැ.පි.
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, උතුරු මැද පළාත — දැ.පි.